

‘මා නිවත්ත අභික්කම’ - නො නැවත ඉදිරියට යවු

| | | |
|---|---|---|
| 56 වන කාණ්ඩය | බු.ව.2557 නවම් මස පුරපසළොස්වකද<br>ක්‍රි.ව. 2014 පෙබරවාරි මස 14 වන ද | 10 වන කලබ |

# මනු ලොව මල්

බුදුනු කිතුනු හින්දු හා
මහම්මදි සියල් දනන්
සිහළ දෙමළ හා අනෙක්
නන් වගේ ලොවේ දනන්
එක් ම රෝස ගස් අරන්
සිටෙව්වොතින් සමාන සේ
පිපෙන්නෙ එක් ම රෝස මල්

එහෙත් අනේ ඔවුන් හදේ
මිනිස් කමේ දයා කුසුම්
පිපෙන්නෙ එක් ලෙසින් නොවේ !
පටු හැඟුම් ඉවත් කරන්
පොදු ඇසින් බලා ලෙවන්
හදේ දයා තවන් කළොත්
පිජේ සුගන්ධවත් කුසුම්

- අනඳ



# අතිපූජ්‍ය වැලිගම ශ්‍රී ඥාණරතන මහනාහිමිපාණෝ

**කොළඹ විද්‍යෝදය පරිවේණාධිපති**
**දර්ශනපති පූජ්‍ය බලන්ගොඩ සෝභිත**
**නාහිමිපාණන් වහන්සේ**

කවදත් ලක්මවගේ වික්මැති පුතුන් බිහි වූයේ දකුණු ලකිනි. පූර්වෝක්තය යළි යළිත් සනාථ කරමින් ලක් සම්බුදුසසුනට අනුපමේය සේවාවක් සිදුකළ අතිගෞරවාර්හ වැලිගම ශ්‍රී ඥාණරතනාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේ දක්ෂිණ ලංකාවෙන් බිහි ව ලොව ම බබුළුවාලූ විශිෂ්ට ගණයේ බුද්ධ පුත්‍රයාණ කෙනෙක් වූහ.

වර්ෂ 1913 වප් මස 14 වැනි දින උපත ලැබූ උන්වහන්සේ 1925 ඉල් මස 30 වැනි දින උතුම් ප්‍රව්‍රජ්‍යා භූමියට පිළිපන්හ. උගතමනා බණ දහම් ගුරු ඇසුරෙන් පොහොණි වූ හෙරණපාණෝ ධර්ම විනය ශබ්ද ශාස්ත්‍ර හැදෑරීම පිණිස කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණට ඇතුළත් වූහ. විද්‍යෝදය පරිවෙණාධිපති ව වැඩ විසූ පණ්ඩිත ශිරෝමණී කහවේ ශ්‍රී සුමංගල රතනසාරාභිධාන නායක මාහිමිපාණන් වහන්සේ සමයෙහි දීප්තිමත් ශිෂ්‍ය ජීවිතයකට උරුමකම් කී උන්වහන්සේගේ සමකාලීනයන් වූවාහු අප ගුරුදේවෝත්තම අකුරටියේ

ශ්‍රී අමරවංසාභිධාන නායක මාහිමිපාණන් වහන්සේ හා අතිපූජ්‍ය හම්මලව ශ්‍රී සද්ධාතිස්ස, වෙඩරුවේ අනෝමදස්සී, ගණේගම සරණංකර, කපුගම සුමනවංස මාහිමිවරුන් වැනි විශිෂ්ට ගණයේ ධර්මශාස්ත්‍රධරයන් වහන්සේලා ය. විදුදය වෙතින් ලැබිය යුතු ශබ්ද ශාස්ත්‍රාදිය මනා කොට ලද උන්වහන්සේ රාජකීය පණ්ඩිතෝපාධිය උත්තීරණය කරනු ලැබූයේ ඕදිරිස්හාමි විනය ත්‍යාගය ද හිමිකර ගනිමිනි.

කීමෙහි බිණීමෙහි උපන් හපන්කම් ඇති ඤාණරතන මහනාහිමියෝ සිය ජීවන ගමනේ දී සාහිත්‍ය ලෝකයට අත්කර දුන් ග්‍රන්ථ සංඛ්‍යාව ශතාධික ය. උන්වහන්සේගේ ධර්මදේශනා විලාසය කෙතරම් ජනප්‍රිය වූයේ ද යන්න ගුවන් විදුලියේ නිත්‍ය ධර්මදේශකයෙකු වශයෙන් කටයුතු කිරීමෙන් ම තහවුරු වේ.

රට, දය, සමයට අපමණ ඇලුම් කළ උන්වහන්සේ එහි අභිවෘද්ධිය හා ආරක්ෂාව පිණිස පුරෝගාමී මෙහෙවරක නියැළුණහ. එහිලා උන්වහන්සේගේ හඬ ගැඹුරුය. තිරසරය. එයින් ඇතමෙකුගේ හිත් අමනාප වුව ද එම හඬ සමස්ත ජාතියේ ම ආරක්ෂාව පිණිස හේතු විය.

උන්වහන්සේ සතු ධර්ම විනය විශාරදත්වය විස්මයාවහ වූවකි. ඒ දැනීම පොතපතින් පමණක් ම ලබා ගත්තක් නොව භාවිතයෙන් ම තහවුරු කරගත්තකි. දශක දෙකකට ආසන්න කාලයක් සංක්ෂිප්ත ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් හා සභාපතිවරයෙකු වශයෙන් කටයුතු කිරීමේ දී ඇතැම් ධර්ම විනය කොටස් පිළිබඳ උන්වහන්සේ සතු දැනීම සහ ස්මරණය විශිෂ්ට

වූවක් බව එහි කලක සිට කටයුතු කරණ මම හොඳින් දනිමි. බුරුම රට පැවති ඡට්ඨ සංගායනාවේ සමාජිකයෙකු වශයෙන් ඒ සඳහා සහභාගි වී කළ සේවය සදානුස්මරණීය වූවකි. සීමා බන්ධනය පිළිබඳ උන්වහන්සේ සතු විනය විශේෂඥතාව අප සැමට ආදර්ශයකි. උන්වහන්සේගේ තීරණයන් නිසා ඇතැම් සීමා සම්මතයන් පිළිබඳ පැවති දුර්මත ඛණ්ඩනය වූ බව රහසක් නොවේ. මෙරට හා පිටරට බොහෝ සිල්වත් විනයධර භික්ෂූහු තම විනය ගැටලු නිරාකරණය කරගැනීම පිණිස උන්වහන්සේ කරා ඇදී ආහ. යමෙකු අතින් යම් විනය කරුණක් උල්ලංඝනය වන අයුරක් දුටු සැණින් තරාතිරම නොබලා පෙන්වා දීම උන්වහන්සේගේ චරිතයේ අපූරු ලක්ෂණයක් විය.

උන්වහන්සේගේ මුව'ග රැව් දුන් වදනක් වූයේ මේ සියලුම හැකියාවන් තමන්වහන්සේ සතු වූයේ විද්‍යෝදය පිරිවෙණින් ලද උසස් ධර්ම ශාස්ත්‍රීය ශික්ෂණය නිසා බවයි. ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යාවිශාරද උපාධිය හැදෑරීම සඳහා අවශ්‍ය පරීක්ෂණයට ඉදිරිපත් කිරීම සඳහා විද්‍යෝදය පිරිවෙණින් නිකුත් කළ සහතිකයේ පණ්ඩිත ශිරෝමණී බද්දේගම ශ්‍රී පියරතනාභිධාන නායක මාහිමිපාණන් වහන්සේ සඳහන් කොට ඇත්තේ ධර්ම විනය ශබ්දශාස්ත්‍රයන්හි ප්‍රාමාණික ශික්ෂණයක් ලබා ඇති බැවින් ඒ සඳහා අත්‍යන්තයෙන් ම සුදුසු වන බවයි. මේ සියල්ලෙන් ම පැහැදිලි වන්නේ උන්වහන්සේ විද්‍යෝදය පිරිවෙණ වෙතින් ලද හැකි ශාස්ත්‍රීය ශික්ෂණයෙහි මනා ලෙස සුශික්ෂිත වූ බවයි. එනිසා ම උන්වහන්සේ විදුදය ගුරුකුලයට දක්වූයේ අසාමාන්‍ය ළෙන්ගතු කමකි. කිනම් හෝ පින්කම් උත්සවාදියක් යෙදුණේ වී නම්

ඒ සඳහා ස්ථිරව ම වැඩම කළ දීප්තිමත් ආදිශිෂ්‍යයන් වහන්සේලා කිහිප නම අතර මුන්වහන්සේගේ නාමය ද මුල් පෙළෙහිලා සටහන් වේ.

විද්‍යොදය පිරිවෙණින් බිහි වී අත්‍යුදාර ලෝක ශාසනික සේවාවන්හි නිරත දීප්තිමත් ආදිශිෂ්‍යයන් උදෙසා ස්වකීය ගුරු කුලයෙන් පිරිනැමෙන ඉහළම ගෞරවෝපාධිය වන “ශ්‍රී සුමංගල විද්‍යාවතංස” ගෞරවෝපාධියෙන් ඥාණරතන මහනාහිමියන් සම්මානනය කිරීමට විද්‍යොදය පිරිවෙණ අමතක කළේ නැත. විදුදයේ විශිෂ්ටයන් දහස් ගණනින් ලෝක ශාසනික සේවාවන්හි නිරත වුව ද විශිෂ්ටයන් අතර සුවිශිෂ්ටයන්ට පමණක් පිරිනැමෙන මෙම සම්මානය මේ වන විට පිරිනමා ඇත්තේ අතේ ඇඟිලි ගණනටත් වඩා අඩු සංඛ්‍යාවකට පමණක් බව මෙහිලා විශේෂයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතියටත් බෞද්ධ අධ්‍යාපනයේ ප්‍රගමනයටත් ප්‍රාචීන භාෂා ශාස්ත්‍රාදියේ සංවර්ධනයටත් සිංහල බෞද්ධ ජාතික අනන්‍යතාවේ අභිවර්ධනයටත් අත්‍යුදාර යුග මෙහෙවරක් සිදු කොට අපවත් වී වදාළ, විද්‍යොදය පිරිවෙණේ දීප්තිමත් ආදිශිෂ්‍ය රත්නයක් වූ ද, ශ්‍රී ලංකා අමරපුර ධර්මරක්ෂිත මහා නිකායේ මහානායක ධුරන්ධර, රාජකීය පණ්ඩිත, ශ්‍රී සුමංගල විද්‍යාවතංස, අග්ගමහා පණ්ඩිත, විනය විශාරද, අතිපූජ්‍ය වැලිගම ශ්‍රී ඥාණරතනාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේට අමාමහ නිවන් සුව අත්වේවා!



# අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහානිකායේ සංවේගය

**(අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායයේ සමලේඛකාධිකාරී අතිගරු දෙණිපිටියේ සෝමරතන, අතිගරු කිතලගම හේමසාර යන නාහිමිපාණන් වහන්සේලා විසින් නිකුත් කරන ලද්දකි)**

ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත ධර්මධර ධර්මානුධර්මප්‍රතිපන්න බුද්ධ ශ්‍රාවකයාණන් වහන්සේ මුළු ලොවට ම සඳ වැනියහ. හිරු වැනියහ. එවන් ගුණ සමුදයකින් පිරිපුන් මහා යතිවරයාණන් වහන්සේ නමකි, රත්මලානේ මල්ලිකාරාමාධිපතිව වැඩ විසූ අපවත් වී වදළ රාජකීය පණ්ඩිත, විනය විශාරද ශ්‍රී සුමංගල විද්‍යාවතංස ධර්මකීර්ති ශ්‍රී අග්ගමහාපණ්ඩිත අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායේ මහානායක ධූරීණ අතිපූජ්‍ය වැලිගම ඤාණරතනාභිධාන මහානායක මහා ස්වාමින්ද්‍රයාණන් වහන්සේ.

1913 ඔක්තෝම්බර් 14 වන ද දකුණු ලක වැලිගම පුරවරයේ දී ජන්ම ලාභය ලබා අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත සඟපරපුරේ කීර්තිමත් අහංගම එළුකැටිය සඟපරපුරේ අතිපූජ්‍ය අහංගම විමලසාර මහා ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ගේ අතිජාත ශිෂ්‍ය රත්නයක් ව 1925 දී ප්‍රව්‍රජ්‍යා

භූමියට පත්වූහ. 1933 දී අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලැබූ වැලිගම ඤාණරතන ස්වාමීන් වහන්සේ කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය මහ පිරිවෙනෙහි අධ්‍යාපනය ලබමින් ප්‍රාචීන පණ්ඩිත උපාධිය සමත් වූහ.

ඉන් පසු බම්බලපිටියේ සිරි වජිරාරාමයේ නේවාසික ස්වාමීන් වහන්සේ නමක් ලෙස අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමිපාණන් වහන්සේගෙන් තම පැවිදි ජීවිතය අර්ථවත් කරගෙන විනයධර-ධර්මානුධර්ම ප්‍රතිපත්තිවලින් පිරිපුන් ව්‍යක්ත ධර්මදේශකයාණන් වහන්සේ නමක් වූහ.

අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මාහිමිපාණන් වහන්සේ ගේ අපවත්වීමෙන් පසු අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත නිකායේ මහානායක ධුරය සඳහා අතිපූජ්‍ය මඩිහේ සිරි පඤ්ඤාසීහ මහා ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ පත්කර ගැනීමට පුරෝගාමිත්වය දරූ වැලිගම ඤාණරතන පණ්ඩිත හාමුදුරුවෝ 1955 දී එම නිකායේ සමලේකම්වරයෙකු ලෙස පත්ව වසර 25 ක පමණ කාලයක් නිකායේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කළහ. පාර්ශ්ව 22 කට බෙදී පැවති අමරපුර නිකාය සමස්ත ලංකා අමරපුර සංඝ සභාව නමින් ඒකාබද්ධ කිරීමට අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමිපාණන් වහන්සේ සමඟ ක්‍රියාකළ අතිපූජ්‍ය වැලිගම ඤාණරතන මහා ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ එම සංඝ සභාවේ සම ලේඛකාධිකාරී ධුරය වසර 19 ක් දරමින් සංඝ ශාසනයේ උන්නතිය සඳහා ක්‍රියා කළහ.

දෙස්-විදෙස් රටවල විවිධ ශාසනික කටයුතු සඳහා වැඩම කළ අතිපූජ්‍ය වැලිගම මහානාහිමිපාණෝ ව්‍යක්ත

ධර්ම කථිකයන් වහන්සේ නමක් ලෙස මෙන් ම දක්‍ෂ ලේඛකයකු ලෙස ද විවිධ සූත්‍ර-මාතෘකා කැරගෙන ධර්ම ග්‍රන්ථ රාශියක් රචනා කළහ.

අතිපූජ්‍ය වැලිගම පණ්ඩිත ස්වාමින්ද්‍රයන් වහන්සේ ගේ ශීලගුණය, තපෝගුණය, බහුශ්‍රැත භාවය විනයගරුක භාවය අගයකරමින් පරම පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහනායක මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන ධර්මරක්‍ෂිත සංඝ සභාව විසින් උන්වහන්සේ ඒකච්ඡන්දයෙන් අනුනායක ධුරයට පත් කරනු ලැබූ හ. 2003 සැප්තැම්බර 8 වන ද පරම පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමිපාණන් වහන්සේ අපවත්වීමෙන් පසු අතිපූජ්‍ය වැලිගම ඤාණරතන අනුනායක මාහිමිපාණන් වහන්සේ මහනායක ධුරයට පත් කැරුණහ.

1959 සිට රත්මලානේ මල්ලිකාරාම මහාවිහාරස්ථානයේ වැඩ වසමින් වසර දශක අටකට අධික කාලයක් ශික්‍ෂාකාමී ව අදීන ව එඩිතර ව උතුම් සසුන් සේවාවක් ඉටුකළ අපේ අතිපූජ්‍ය වැලිගම ශ්‍රී ඤාණරතන මහානායක මාහිමිපාණන් වහන්සේට අමරපුර ශ්‍රී ධර්මරක්‍ෂිත මහානිකායේ සියලු ම විහාරස්ථානයන්හි භික්‍ෂු සංඝයාගේ සාතිශය සංවේගය බුහුමන් පෙරටුව මෙයින් පළ කර සිටිමු.



# නිවනින් නිවෙත් වා !

**(අපවත් වී වදාළ අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය වැලිගම ඤාණරතන මහානායක මාහිමිපාණන් වහන්සේ පිළිබඳ ගුණ සම්භාවනයකි.)**

දසතම බැලිම්, ඒ හැම දෙස අද හිස් ය
ගරුතම පැවිදි දිවියට එතුමෝ දෙස් ය
සුදුසුම දෑ කරන්නට ඇහැරුණු ඇස් ය
වැලිගම මහා නා හිමි අප හැරැ ගොස් ය

අග මහ පඬි ය, දම්රැකි මහ නා සඳු ය
කග මෙන් දැඩි වුව ද හිමි හදවත මුදු ය
දිග හැර දෙසූ බණ පද සුගම ය පොදු ය
අග සිට මුලට සුවඳැති සඳුනක් බඳු ය

විදුදය පිරුවනින් ලැබ දම්-සද සතර
සිදු කැර ගත්හ දිවියට නව මං හසර
විදුර'රමට පැමිණ එහි මාහිමි ඇසුර
ඉඳුරා ලබන්නට පින ලදුවෝ පවර

සම්දිටු දහම හෙළි කළ බුදු පුත් සව්වෝ
නම් කිත් යසස් නො පතා ඉදු මඟ සෙව්වෝ
දම් විනයට ම අනුරූ ලෙස දිවි ගෙව්වෝ
'දම්රැකි' සඟ ගණට ඔබ නිසි පණ පෙව්වෝ

පවර මඬිහෙ මහ නා සමිඳුන් සමඟ
සතර දිගත වඩිමින් මෙ ලකෙහි නෙ මඟ
අමරපුර නිකා සමඟිය කළො එකඟ
අමර වේ සුවඳ එහි විහිදේ ලොවග

කුඩා කල සිට ම පිය සෙනෙහස ඇතිව
වඩා සුත පෙමින් අප සැනැහූ රැතිව
කුඩා නැත හිමිඳු කළ මෙහෙවර බැතිව
කඩා ඇද හැලෙයි කඳුළැලි හිමි නැතිව

මියුරු ළබැඳි තෙපුලැති සුගුණැති හදෙක!
පවුරු වූහ, යුත්තිය-විනයට නිසැක
අබිරු අබිමනැති මාහිමි ගුණ ගඟෙක!
ඉවුරු නො බිඳ එහි පිහිනමු හැම දිනෙක

රුවනින් රුවනාර වන් ගුණ කඳාණෝ
මුදුනින් බැබැළෙමින් හුන් සිහ රදණෝ
නුවණින් සපිරි දම් රැකි සඟ රදණෝ
නිවනින් නිවෙත් වා මාහිමි සඳාණෝ

**- තිරිකුණාමලේ ආනන්ද මහානා හිමි**



**සීල මෙව ඉධ අග්ගං - පඤ්ඤවා පන උත්තමො**
**මනුස්සෙසු ච දෙවෙසු - සීල පඤ්ඤාණතො ජයං**

මෙහි ශීලයම උතුම්. නුවණැත්තේ ශ්‍රේෂ්ට වේ. මිනිසුන් කෙරෙහි ද දෙවියන් කෙරෙහි ද ශීල ප්‍රඥා දෙකින් ජය ලැබේ.



# අත්ථස්සද්වාර ජාතකය

කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණී
ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ මෙම ජාතක කථාව දේශනා කළේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ වසන කල්හි ය.

එකල සැවැත් නුවර විසූ ධනවත් සිටුවරයකු හට සත් හැවිරිදි, ඉතා බුද්ධිමත් පුතෙක් සිටියේ ය. එක් දිනෙක මේ සිටු කුමරු තම පියාණන්ගෙන් දියුණු වී, යහපත් ජීවිතයක් ගත කරන්නට නම්, කළ යුතු දේ කුමක්ද යි ඇසී ය. සිටුතුමාහට මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට නොහැකි විය. බුදුරජාණන් වහන්සේගෙන් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබාගත හැකි යැයි සිතූ සිටුතුමා පුතු සමඟ ජේතවනාරාමයට ගියේ ය. සිටුතුමා තමා පැමිණි කාරණය බුදුරජාණන් වහන්සේ වෙතින් විමසූ සැණෙකින් ම මෙම ප්‍රශ්නයට ඈත අතීතයේ දිනෙක ද පිළිතුරු ලබා දී ඇති බව සිහිපත් කළ සේක. අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ධර්ම ශ්‍රවණය පිණිස වැඩ සිටි භික්ෂූන් වහන්සේලා අමතා, මෙම සිටු පුතණුවන් අතීත භවයක දීත් තම පියාණන්ගෙන් මේ ආකාරයෙන් ම ප්‍රශ්න කළ බව වදරා අතීත කථාව දේශනා කළ සේක.

ඈත අතීතයේ බ්‍රහ්මදත්ත රජ සමයෙහි අප මහ බෝසතාණන් වහන්සේ මහා ධනයක් හිමි වෙළෙඳ සිටුවරයෙකුව උපන්හ. ඒ සිටුතුමාහට ද තියුණු බුද්ධියක් ඇති පුතෙක් සිටියේ ය. කුඩා අවධියේ දී එනම් සත් හැවිරිදි වියේ දී පවා හොඳ නරක කුමක් දැයි තෝරා බේරා ගැනීමට ඒ අනුව ක්‍රියා කිරීමට එම සිටුකුමරාට හැකි විය. යම් වැඩක් පටන් ගැනීමට පෙර මෙම දරුවා හොඳින් විමසිල්මත් වූයේ ය. ඔහු වැඩිහිටියන්ගෙන් නො දන්නා දේ අසා ගති. වැඩිහිටියන්ගෙන් උපදෙස් ලබාගති. එමෙන් ම එම අවවාද හොඳින් පිළිපැද්දේ ය. දිනක් මේ සිටුපුතු තම පියාගෙන් බැරෑරුම් ප්‍රශ්නයක් ඇසී ය.

''පියාණෙනි, දියුණුවීමට කළ යුතු දේ පහද දුන මැනව''

'පුත, දියුණුවීමට නම් කරුණු බොහෝ ඇත. කෙටියෙන් ඔබට කියා දෙමි. අසා ගන්නැ''යි බෝසත් සිටුතුමා කීවේ ය. පුත, දියුණු වී හොඳින් ජීවත් වීමට නම් පළමුව නීරෝගී බව රැකගන්න. ඒ රෝගී වූ විට හරි හැටි වැඩ කටයුතු කර ගැනීමට නොහැකි නිසා.

දෙවනුව සිත සන්සුන් විය යුතුයි. සිත නිරෝගී කරගත යුතු යි. එහි තේරුම තදබල ආශාවන්, ක්‍රෝධයන් වැනි නරක සිතුවිලි සිතෙහි ඇති කරගත යුතු නැත. ඒ වෙනුවට යහපත් සිතිවිලි සිතෙහි ඇති කරගත යුතු යි.

තෙවනුව නුවණින් වැඩි, වයසින් වැඩි, තැන්පත් බවින් වැඩි වැඩිහිටියන් ගේ අවවාද ලබාගත යුතු යි. ඒවා පිළිපැදිය යුතු යි.

සතරවැනි කරුණ නම් බහුශ්‍රැත භාවය යි. එනම් බොහෝ ඇසූ පිරූ තැන් තිබිය යුතු බවයි. එනම් පොත පතින් සමාජයෙන් පරිසරයෙන් ආගම දහමෙන් දැනුම ලබා ගැනීමයි.

පස්වැන්න නම් අප තුන් දොරෙන් (සිත, කය, වචනය) කෙරෙන්නා වූ වැරදි නවත්වා ගත යුතු යි.

සයවැන්න උදාසීන නොවිය යුතු බවයි. කම්මැළි නොවිය යුතු යි. එනම් තමන්ගේ තරාතිරමට අනුව, සතුටින් ක්‍රියා කිරීමයි. උදාහරණ ලෙස ඉගෙනීම, ක්‍රීඩා කිරීම, සමාජ සේවය, රැකියාව වැනි දෑ සතුටින් කළ යුතු යි.

මේ අනුව ජීවත්වුවහොත් පුත, අපට මෙලොව පරලොව දෙකෙහි ම ජය ලබාගත හැකියි. දියුණු වී සතුටින්, යහපත් ලෙස ජීවිතය ගත කළ හැකි යි'' යනුවෙන් සිටුතුමා පැවසී ය.

බ්‍රහ්මදත්ත රජු කල සිටි බෝසත් සිටුතුමා හා පුතු දෙපළ ගැන වදාළ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ එම සිටුතුමා තමන් වහන්සේ යැයි වදාළ අතර, සිටු පුතු මෙදින ප්‍රශ්නය ඇසූ පුතු ම බව දේශනා කළ සේක.

මේ කරුණු අනුගමනය කළ සිටුපුතා දැහැමි යහපත් ජීවිතයක් ගත කළේ ය. බෝසත් සිටුතුමා යහපත් ලෙස ජීවත් වී ආයු කෙළවර මිය පරලොව ගියහ.

අත්ථස්සද්වාර ජාතකය බුදුරජාණන් වහන්සේ භික්ෂූන්හට දේශනා කළමුත්, එය අපහට යහපත් දියුණු ජීවිතයක් ගත කළ හැකි මඟ කියා දේ.



# නිහතමානී ද? අනතිමානී ද?

කොළඹ 07, නාරද බෞද්ධ ධර්මායතනාධිපති
ශාස්ත්‍රපති, පණ්ඩිත
පූජ්‍ය තලල්ලේ චන්දකිත්ති හිමිපාණන් විසිනි

මාන යන වචනයෙහි සාමාන්‍ය අදහස වන්නේ මැනීම යන්නයි. මානය යනුවෙන් හඳුන්වනු ලබන අකුසල චෛතසිකය සිතෙහි ක්‍රියාත්මක වන දෙයක් බැවින් මානය යනු සිතින් කරනු ලබන මැනීමක් වශයෙන් හැඳින්විය හැකියි.

සත්ත්වයාගේ සිත තුළ මානය ඇතිවන්නේ ඇයි ද යන ප්‍රශ්නය කෙනෙකුගෙන් ඇසුවහොත් එයට දිය හැකි හොඳම සහ සෘජුම පිළිතුර වන්නේ ඥාණය නැති නිසාය යන්නයි. සැබැවින් ම මානය ඇති වනුයේ ඥාණය නැති නිසා ය. ඒ අනුව මානය සහ ඥාණය පිළිබඳ කිසියම් විග්‍රහයක් මෙම ලිපියෙන් අපේක්‍ෂා කෙරේ.

පුද්ගල සන්තානයෙහි හටගන්නා වූ බරපතල අකුසල සිතිවිල්ලක් වන මානය මමත්වය පදනම් කරගෙන හට ගන්නකි. සරලව සඳහන් කරන්නේ නම් මම කියා පුද්ගලයෙක් සිටිනවාය යන හැඟීම මුල් කර ගෙන, ඒ මම යන සංකල්පය පදනම් කර ගෙන පුද්ගලයා සිතන ආකාර

තුනකි. ඒ අනුව මානය ප්‍රධාන කොටස් තුනකට වර්ග කර දැක්විය හැකියි. ඒ

1. සෙයාමාන - තමා අනෙක් අයට වඩා උසස් යැයි සිතීම
2. සදිසමාන - තමා අන් අය හා සමාන යැයි සිතීම
3. හීනමාන - තමා අන් අයට වඩා පහත් යැයි සිතීම වශයෙනි.

මේ දක්වන ලද කොටස් තුන පිළිබඳ විමසීමේ දී පෙනී යන්නේ මේ සිතීම් තුන ම තමා, නොඑසේ නම් මම පදනම් කර ගෙන ඇති වන බවයි. මම නැමැති මිණුම් ඒකකය, මිණුම් දණ්ඩ පදනම් කර ගෙන සිතන්නට යන්නේ, මතින්නට යන්නේ මම කියා සත්ත්වයෙක් සිටිනවාය යන හැඟීම නිසා ය.

සාමාන්‍යයෙන් පුහුදුන් සත්ත්වයා මම යනුවෙන් සිතාගෙන සිටින්නේ කුමක් ද? පුහුදුන් සත්ත්වයා මම යනුවෙන් හඳුන්වනුයේ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන මේ පඤ්චස්කන්ධය යයි. ධර්මය පිළිබඳ නිසි අවබෝධයක් නැති පුද්ගලයා මේ කියන ගොඩවල් පහ පිළිබඳ ව කල්පනා කරන, නොඑසේ නම් අල්වා ගන්නා ආකාර තුනක් ඇත. පුහුදුන් පුද්ගලයා මේ ගොඩවල් පහ තමාගේ හෙවත් මගේ බවත්, (ඒතං මම) මේ ගොඩවල් පහ තුළ තමා සිටින බව හෙවත් මම කියා කෙනෙකු සිටින බවත්, (ඒසෝහමස්මි) මේ ගොඩවල් පහ තමන්ට අවශ්‍ය ලෙසින් පාලනය කළ හැකි බවත්, (ඒසෝ මේ අත්තා) සිතනවා. එසේ සිතන්නේ මේ ගොඩවල් පහ පිළිබඳ ව නිසි දැනුමක් හෙවත් ඤාණයක් නැති නිසා ය. මානය

ඇති වන්නේ ඥාණය නැති නිසා ය යනුවෙන් පැවැසූයේ එබැවිනි.

පඤ්චස්කන්ධය ඇසුරු කර ගෙන මම කියා කෙනෙක් සිටිනවාය කියා සිතීමත්, ඒ මම පදනම් කර ගෙන පඤ්චස්කන්ධය මගේ යැයි අල්වා ගැනීමත්, ඒ පඤ්චස්කන්ධය මට අවශ්‍ය ලෙසින් පාලනය කළ හැකි දෙයක් යැයි සිතීමත් හෙවත් දෘෂ්ටිගතවීමත් පඤ්චස්කන්ධය ගැන නිසි ලෙසින් නොදන්නා නිසා සිදු කරන්නකි. එසේ නොදැනෙන්නේ මානය නැතිනම් මමායනය තුළින් ස්කන්ධ පඤ්චකය පිළිබඳව ඇති කරගත යුතු දැනුම වසා දමා තිබෙන බැවිනි.

සත්ත්වයෙකු සිටිනවා යැයි සිතන රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පඤ්චස්කන්ධය තුළ ක්‍රියාත්මක වන යථාර්ථ ස්වරූපය තේරුම් ගන්නා කෙනෙක් ඒ තුළ ක්‍රියාත්මක වන සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් නොසිටින බව වටහා ගනී. සාමාන්‍යයෙන් සම්මුති ලෝකයෙහි සත්ත්වයා වශයෙන් පිළිගැනෙන කෙනා මගේ යැයි කියන දේ තමාට අවශ්‍ය ලෙසින් පාලනය කළ හැකි යැයි විශ්වාස කරයි. එහෙත් සම්මුතිය එය වුවත් පරමාර්ථය හෙවත් යථාර්ථය එය නොවේ. පඤ්චස්කන්ධයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව නුවණින් දකින්නා එහි ඇති යථාස්වභාවය හෙවත් පරමාර්ථය අවබෝධ කර ගනී. මේ පඤ්චස්කන්ධය තමන්ට අවශ්‍ය ලෙසින් පාලනය කළ හැකි දෙයක් නොවන බව තේරුම් ගනී. එබැවින් එය තමන්ගේ වශයෙන් ද කල්පනා නො කරයි. එසේ ම ඒ පඤ්චස්කන්ධය තුළ තමන් සිටිනවා යැයි ද නොසිතයි. ඔහුට ඒ පඤ්චස්කන්ධය පිළිබඳ නිසි

ලෙසින් වැටහුණු බැවිනි. ඥාණය ඇති වුණු බැවිනි. පඤ්චස්කන්ධය පිළිබඳ ඥාණය ඇති වන විට එය පදනම් කර ගෙන ඇති වන මානය ද පෙර පසු නොවී දුරුව යයි.

මානය සහමුලින් ම දුරු කරන ලද්දේ රහතන් වහන්සේ ය. එබැවින් අපගේ භාෂාවේ පද යෙදීමට අනුව රහතන් වහන්සේ හැඳින්විය හැකි ගුණවාචී පදයක් ලෙසින් දැක්විය හැක්කේ නිහතමානී යන පදයයි. එහෙත් නිහතමානී යන පදයේ අදහස නිසි ලෙසින් වටහා ගත්තේ නැති නිසාදෝ එය පුහුදුන්, කෙලෙස් සහිත අයට පවා යොදන ආකාරයක් දක්නට ලැබේ. යම් කෙනෙකු යටහත් පහත් ගති ස්වභාවයෙන් සිටිනවා නම් අනේ එයා හරිම නිහතමානී යැයි කියනවා කොතෙකුත් අසන්නට ලැබේ. නිහතමානී යනු සම්පූර්ණයෙන් ම මානය නසන ලද යන අදහස දෙන පදයයි.

කෙලෙස් නසන ලෝකෝත්තර ආර්ය මාර්ගයේ අර්හත් ඵලය අධිගමනය කරන තුරාවට මානය මද වශයෙන් හෝ චිත්ත සන්තානයේ ක්‍රියාත්මක වේ. සෝතාපත්ති ඵලයට පත් වෙන ආර්ය පුද්ගලයා සක්කායදිට්ඨිය නැති කිරීම තුළින් පඤ්චස්කන්ධයට තමන්ට අයිතියක් කිව නොහැකි යැයි වටහා ගත්තේ ද, ඒ පිළිබඳ ව දැනුවත් වුව ද, ඒ පිළිබඳ නිවැරදි දැක්මක් ඇති කර ගත්තේ ද මම යන හැඟීම නැති වන්නේ නැත. සක්කායදිට්ඨිය ප්‍රහාණය කිරීම තුළින් මගේ කියන හැඟීම ඉවත් කර ගත්තේ නමුත් පඤ්චස්කන්ධය තුළ මම සිටිනවා ය. එය තමන්ට අවශ්‍ය ලෙසින් පාලනය කළ හැකිය යන විශ්වාසය සිත තුළ සියුම් ව ක්‍රියාත්මක වේ. එය අස්මිමානය යනුවෙන් හැඳින්විය හැකි ය. අස්මිමානය පවා

සහමුලින් ම නැති කළ කෙනෙකුට පමණි නිහතමානී යැයි පැවැසිය හැක්කේ. අස්මිමානය සහමුලින් ම ඉවත් වනුයේ අර්හත් ඵලයට පත්වූවාට පසුව ය. ඒ අනුව නිහතමානී යන වචනය යෙදිය හැක්කේ රහතන් වහන්සේලාට පමණි.

රහත් නොවුණු, එහෙත් යටහත් පහත් ගති ස්වභාවයෙන් යුතු අයට යෙදිය හැකි ගුණවාචී පදය කුමක් ද? ඒ අනතිමානී යන පදයයි. කරණීය මෙත්ත සූත්‍රයේ මෛත්‍රීය තමන් තුළ වඩන කෙනෙකුන් විසින් පුරුදු කළ යුතු ගුණයක් ලෙසින් අනතිමානී යන ගුණය ද දක්වා ඇත. න + අතිමානී යන පද දෙක එකතුව අනතිමානී යන තනි පදය සැකැසී ඇත. අධික + මාන නැති යන අදහස ඒ පදයේ ගැබ් වී ඇත. පුහුදුන් සෑම පුද්ගලයෙකුගේ ම සිතෙහි යම් ප්‍රමාණයට මානය ක්‍රියාත්මක වේ. එහෙත් ඇතැම් පුහුදුන් පුද්ගලයන් ගේ වුව මානය ක්‍රියාත්මක වන්නේ ඉතා අඩු වශයෙනි. එසේ මානය අඩු වශයෙන් ක්‍රියාත්මක වන තැනැත්තා අනතිමානී යන ගුණයෙන් හැඳින්වේ. එසේ නම් කෙලෙස් සහිත පුහුදුන් මිනිසුන් අතර සිටින්නේ නිහතමානී අය නොව අනතිමානී අය බව අප වටහා ගත යුතු වේ.

මෙකල ලංකාවේ වාසය කරන ඇතැම් දෙනා අධික මානයෙන් යුතුව කටයුතු කරන බව දක්නට ලැබේ. තමන්ගේ විවිධ බලවත්කම්, කුලවත්කම්, උගත්කම්, රූමත්කම් පදනම් කොට ගෙන තමන් ව හුවා දක්වා ගනිමින් අනුන් ව හෙළා දක්නා ආකාරයක් දක්නට ලැබේ. එය ධර්මයෙහි අත්තුක්කංසනය හා පරවම්භනය යනුවෙන් දක්වා ඇත. අත්ත  උක්කංසනය යනු තමා ඉහළ තබා සළකා කටයුතු කිරීමයි. පර වම්භන යනු අනුන්ව හෙළා දක

කටයුතු කිරීමය. ඇතැමෙක් අනුන්ව හෙළා දක්කේ නැති වුණාට තමන් ව හුවා දක්වා ගන්නා අවස්ථා ද දක්නට ලැබේ. එසේ ම ඇතැමෙක් තමන් හුවා දක්වා ගත්තේ ද නැති වුණාට අනුන් හෙළා දකින්නට රුචි බවක් දක්වති. කෙනෙකු හෙළා දකින්නේ නැතිව කෙනෙකුගේ කුඩා වූ හෝ ගුණයක් දැක සතුටු වන්නට හැකියාව තිබේ නම් ඒ සිත දියුණු තත්ත්වයට පත් කළ කෙනෙකුගේ ස්වභාවයකි.

සාමාන්‍යයෙන් පුහුදුන් පුද්ගලයන් අතින් වැරදි අඩු පාඩු සිදුවීම ස්වභාවයකි. එසේ කෙනෙකු වැරැද්දක් සිදු කළ විට ඒ වැරැද්ද හමුවේ ඇතැම් අය තමන්ගේ මානය වැඩි කර ගන්නා අවස්ථාද දක්නට ඇත. කෙනෙකු වැරැද්දක් කළ පසු ඉතා රළු පරුෂ ආකාරයට හැසිරෙන්නට ඇතැමෙකු පුරුදු වී ඇත්තේ ඒ මානයට යටවීම නිසා ය. ඒ මානය නිසා තමන් අතින් ද එබඳු වැරදි අතීතයේ සිදු වී ඇති බවට ඔහුට මතකයක් නැගෙන්නේ නැත. කෙනෙකු වරදක් සිදු කළ පසු එබඳු වරදක් කළ ලෝකයේ සිටින එක ම කෙනා හා පළමු කෙනා වශයෙන් සළකා දොස් නගන්නට පෙළඹෙනුයේ ඒ මානය මඟින් තම අතීත මතකයන් වළලා දමා ඇති බැවිනි. කෙනෙකු වරදක් කළ පසු එයට අනවශ්‍ය ලෙසින් නොකිපී මා අතින් ද මෙවැනි වැරදි අතීතයේ සිදු ව තිබෙනවා යැයි කල්පනා කරන කෙනාගේ මානය යටපත් වෙනවා පමණක් නොව ඒ තුළ ඤාණය උපදවා ගෙන අනවශ්‍ය ලෙසින් නැඟී එන කෝපය ද පාලනය කර ගැනීමට ඒ තැනැත්තා සමත් වෙයි. එපමණක් ද නොව ඒ වරද සිදු වූ තැනැත්තාට අනුකම්පා කොට, කරුණාව, මෛත්‍රිය දක්වා නැවත එබඳු වැරැදි නොවන්නට මග ද පෙන්වයි.

මානය සිතෙහි දරා ගෙන මරණයට පත් වන අය වඳුරන් වන බවත්, අධික මානයෙන් මැරෙන අය සුනඛයන් වන බවත් අපගේ ධර්ම සාහිත්‍යයේ සඳහන් වී ඇත (මානේන මක්කටෝ හොති, අතිමානෙන කුක්කුරෝ) එබැවින් කලකින් ලබා ගත හැකි, දුර්ලභ වූ මිනිසත් බවක් ලබා ගත් ඔබ අනවශ්‍ය ලෙසින් මානය හිතෙහි දරාගෙන කටයුතු කොට නිරයගාමී වුවහොත් දුර්ලභ ව ලැබූ මේ මිනිසත් බවින් නිසි ඵල නෙළා ගත්තා වෙන්නේ නැත. එබැවින් නුවණැති පුද්ගලයෝ සිතෙහි නිර්මලභාවය නැති කරන මානය නැමැති කෙලෙස් මල සෝදා හරින්නට උත්සාහ කරත්වා!

ගිහියන් ගුණවත් කිරීම පිණිස අවවාදානුශාසනා කළ යුතු ය. ගිහියන් තුළ නොමැති ගුණධර්ම ඇති කර විය යුතු ය. තිබෙන ගුණධර්ම තව තවත් වැඩිදියුණු කළ යුතු ය. විශේෂයෙන් ම ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා යන ගුණවලින් ගිහියා පොෂණය කට යුතු ය. කල්‍යාණ මිත්‍රාශ්‍රය සලසාදිය යුතු ය. වාරයක් දෙවාරයක් නොව බොහෝවිට ගුණ දහම්හි යොදවාලිය යුතු ය. එසේ නොකරතොත් එය යුතුකම් පැහැර හැරුමෙකි. ගිහියන් ගුණවතුන් කිරීමට භික්ෂුවගේ සංවරය ද ඉවහල් වන බව අමතක නොකට යුත්තකි.

**අතිපූජ්‍ය වැලිගම ඤාණරතන** මහානායක මාහිමිපාණන් වහන්සේ ''පැවිදි සුවය'' කෘතියෙනි